# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1984/20 - 2016 සැප්තැම්බර් මස 13 වැනි අඟහරුවාදා - 2016.09.13**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය**

අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරුන් විසින් රාජ්‍ය අමාත්‍යවරුන් සහ නියෝජ්‍ය අමාත්‍යවරුන් වෙත කාර්ය භාරය පවරා දීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 43 වැනි ව්‍යවස්ථාවේ (i) අනු ව්‍යවස්ථාව යටතේ අංක 1933/13 හා 2015.09.21 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් මා වෙත පවරා ඇති විෂයන් හා කාර්යයන් අතුරින් පහත උපලේඛනයේ දැක්වෙන විෂයන් හා කාර්යයන් පමණක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වන ව්‍යවස්ථාවේ (5) වන අනු ව්‍යවස්ථාව ප්‍රකාරව මෙම නිවේදනයේ දින සිට නගර සැලසුම් හා ජල සම්පාදන රාජ්‍ය අමාත්‍යවරයා වෙත පවරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

රවුෆ් හකීම්,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය.

2016 සැප්තැම්බර් මස 05 වැනි දින,
අංක 35, "ලක්දිය මැදුර",
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ දී ය.

**උපලේඛනය**

**නගර සැලසුම් හා ජල සම්පාදන රාජ්‍ය අමාත්‍යවරයා**

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| *කාර්යයන් හා කරන ව්‍යාපෘති* | *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන සහ රාජ්‍ය සංස්ථා* | *ක්‍රියාත්මක කළ යුතු පනත්* |
| 01. සෑම පුරවැසියෙකුටම පිරිසිදු පානීය ජලය ලබාදීම තහවුරු කිරීම සඳහා වන ක්‍රියා මාර්ග ගැනීම<br>02. ප්‍රජා ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘති කාර්යය හා විධිමත් කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම | ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව | ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තු පනත් |

09 - 1021

1A - G 24213 — 358 (2016/09) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*